**කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය**

THE WORLD BANK

**<u>ව්‍යාපෘති සහාය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම</u>**

**ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය (IRDCRP) යනු ශ්‍රී ලංකා රජය (GOSL) සහ ලෝක බැංකුව (WB) එක්ව මුදල් සැපයෙන, කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියකි.**

**මුළු ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 103 ක් වන අතර එය කෘෂිකර්මාන්තය, පශු සම්පත්, ධීවර හා වැවිලි යන උප අංශවල කුඩා හා මධ්‍ය පරිමාණ වතු හිමියන්ට සහාය වීම සඳහා නිර්මාණය කර ඇති අතර, ගොවිපලෙහි වටිනාකම් දාමය ඔස්සේ හඳුනාගත් අඩුපාඩු ආමන්ත්‍රණය කිරීම සඳහා නිර්මාණය කර ඇත.**

**මෙම ව්‍යාපෘතිය වසර 05 ක ව්‍යාපෘතියක් වන අතර, මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශවල කෘෂි ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායිතාව, තරඟකාරිත්වය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමයි.**

**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් තනතුර පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වැටුප සහ** බඳවා ගැනීමේ අනෙකුත් කොන්දේසි **2026 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2026 මත පදනම් වේ.**

| අංක. | තනතුර | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප (රු) | |
|---|---|---|---|---|
| | | | වැටුප් කාණ්ඩ | වැටුප් තල |
| 01 | රියදුරු | 02 | PL - 3 | Rs. 41,209.00 + (41,209 x 50%) = Rs. 61,813.50+ ජීවන වියදම් දීමනාව |

**<u>තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ පළපුරුද්ද</u>**

## <u>තනතුර - රියදුරු (PL 3)</u>

**1.** අධ්‍යාපන සුදුසුකම්*:*

සිංහල / දෙමළ භාෂාව ඇතුළුව අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව, විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර, එම ප්‍රතිඵල වාර දෙකකට නොවැඩි සංඛ්‍යාවක් තුළ ලබාගෙන තිබිය යුතුය.

**2.** තාක්ෂණික කුසලතා :

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍රයක් සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

**3.** ***වයස :***

- වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
- වයස අවුරුදු 50 නොඉක්මවිය යුතුය.

<u>ශිල්පීය නිපුණතා</u>

i. මෝටර් කාර්මික පිළිබඳ මූලික අවබෝධය
ii. ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව

**සාමාන්‍ය කොන්දේසි**

- විදේශ අරමුදල් සපයන ව්‍යාපෘතියක සේවා පළපුරුද්ද.
- ව්‍යාපෘතියේ අවශ්‍යතාවය අනුව ක්ෂේත්‍ර රාජකාරීවල නිරත වීම.
- රජයේ නීති රීති පිළිබඳ අවබෝධය අවශ්‍ය වේ.
- සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත් සහ ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.
- ඕනෑම ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත්**

සියලුම අයදුම්කරුවන් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු සමඟ තම ජීව දත්ත පත්‍රය සහ සියලුම සහතිකවල සහතික කළ පිටපත් ද ඇතුළුව ලියාපදිංචි තැපෑලෙන් **2026.07.23** වෙනි දින හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට යොමු කරන ලෙසත්, ඔබගේ අයදුම්පත irdcrp_moa@agrimin.gov.lk වෙත විද්‍යුත් තැපැලට ද යොමු කරන්න.

අයදුම්පත අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය,**
**නොං:123/2, පන්නිපිටිය පාර,**
**බත්තරමුල්ල.**

**ලේකම්,**
**කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**